## 22 – ගයමු වයමු

ගයමු වයමු සමිඳු පසසලා – සවන පිනන තාල සදාලා
සමිඳු වඳිමු සැවොම එක්වෙලා – අරුත් සපිරි වදන් ගොතාලා

හිරුට එළිය දුන්නේ කවුරුදෝ? (කවුරුදෝ)
සඳුගෙ සිසිල ලැබුනෙ කොහෙන්දෝ? (කොහෙන්දෝ)
දහසක් තරු වැව්වෙ කවුරුදෝ? (කවුරුදෝ)
මිනිස් ලොවද තැනුව දෙවිඳුනේ

දේදුන්නෙ පාට ගෑවෙ කවුරුදෝ? (කවුරුදෝ)
මලට සුවඳ හැමුවේ කොහෙන්දෝ? (කොහෙන්දෝ)
කුරුළු ගීත ගෙතුවෙ කවුරුදෝ? (කවුරුදෝ)
සොබා දහම මැව්ව දෙවිඳුනේ

කඳුද හෙල් ද මැව්වෙ කවුරුදෝ? (කවුරුදෝ)
දි’යැලි ගඟ සොයන්නෙ කවුරුදෝ? (කවුරුදෝ)
පිපුන තෙළුම සෙව්වේ කවුරුදෝ? (කවුරුදෝ)
සැවොම එක්ව වඳින දෙවිඳුනේ